# 08 ජනකවි

ජනශ්‍රැතිය අපේ සංස්කෘතියේ අංගයකි. එය ඉතා හරවත් ය. විවිධ ය. ජනශ්‍රැතියෙන් රටක විවිධ ජන කණ්ඩායම්වල ව්‍යවහාර විද්‍යමාන වේ. ඒ ව්‍යවහාර ඔවුන්ගේ ජන විඥානය ද කියාපායි. එමෙන් ම ඔවුන්ගේ අනන්‍යතාව රඳා ඇත්තේ ද ඒ බස් වහර තුළ ය. මේ ජන කණ්ඩායම්වලට අයත් ජනශ්‍රැති විශේෂයක් ලෙස සැලකිය හැක්කකි, ජන කවිය. ඒ ඒ ජන කණ්ඩායම්වල බස්වහර පිළිබඳ ව දැන ගැනීමට ද ජනකවිය ප්‍රබල ම උපකාරකයකි.

ජනතාව අතරින් පෝෂණය වී ඔවුන්ගේ කඳුළත්, සිනහවත්, වේදනාවත් සුන්දර ආකෘතියකින් ඔවුන්ට හිමි කර දෙන ජනකවිය, ඇතැම් ප්‍රබුද්ධ කවියේ පවා නැති රස ජනනය කිරීමේ ශක්‍යතාවක් හිමිකර ගෙන ඇත. පුද්ගල මනස තුළ ම නිරායාසයෙන් ගලා ආ හැඟීම් රසවත් ව ඉදිරිපත් කිරීමත් නිර්මල වූ ප්‍රකාශනයත් මීට හේතු වී තිබේ.

පොදු ජනතාවගේ විවිධ ජීවන වෘත්තීන්හි දී පවත්නා කාන්සියෙන්, මහන්සියෙන් හා හුදකලා බවින් මොහොතකට හෝ මිදීම සඳහා ඔවුහු ජනකවි කීහ. මේ පාඩමට ඇතුළත් වන්නේ එබඳු ජනකවි කීපයකි. විවිධ වෘත්තීන්හි භාවිත වන විවිධ ප්‍රදේශවල පවත්නා භාෂාවේ විවිධ ස්වරූප ගැන අවධානය යොමු කිරීමටත්, ඒවා භාවිත කර සන්නිවේදනය පහසු කර ගැනීමටත් ඒ මඟින් හැකිවනු ඇත.



කෙත හා ජනකවිය අතර ඇත්තේ අවියෝජනීය වූ සබඳතාවකි. ගැමියෝ සිය ගොවි ජීවිතයේ දී කාන්සිය මඟ හරවා ගැනීමට කවි කියූහ. විශේෂයෙන් ගොයම් කැපීම සඳහා කියූ කවි අතිශයින් රසවත් ය. මේ එවැනි කවි කීපයකි.

සිටිති පෙළින් පෙළ රන්තරු විලසට
ගනිති එරන් කැති දහසක් එමවිට
දමති එරන් කැති මාරුව අහසට
කපති ගොයම් අඟනෝ බැස කුඹුරට

නළා පිඹිති දෙපසේ බෙර නද කොට
බලා සිටිති රජු ඇවිදින එතනට
වලා යටින් සඳ පෑවූ විලසට
බලා සෙනඟ නිම නැත කුඹුරේ වට

කෙතක ගොයම් පැළ නිල දිලිසෙනවා
විටක ඉඳන් මල් වඩම් තනනවා
කෙතට ඉඳින් මල් මාල තනනවා
මලක බඹරු සේ වට නද දෙනවා

බඹර කැපීම දුෂ්කර කාර්යයකි. එහෙත් බඹර කපන්නා එය ප්‍රියමනාප ව කරන බවත්, ජනකවියා එය සෞන්දර්යාත්මක ව පවසා ඇති සැටිත් මේ කවිවලින් පෙනේ.



බැද්ද වටට සුදු මොරමල් පිපීලා
සද්ද කර බඹරු ඒ වග අසාලා
ඉටිත් පැණිත් ලොව හැමට ම බෙදලා
යන්නන් බඹරු දුක් මැසිවිලි කියාලා

රොනට යන බඹරු රොන් අරගෙන යද්දි
මලට යන බඹරු මල් අරගෙන යද්දි
දියට යන බඹරු දිය අරගෙන යද්දි
යන්ට යන බඹරු අඬ අරගෙන යද්දි

මලේ හැම තැනම බඹරුන් අඬන්නා
බඹර බැන්ද තැන් අපි වද සොයන්නා
බඹර කපා පැණි සැමටම බෙදන්නා
බඹරු තොපට පින් අත්වෙයි කියන්නා

පුරාණ ගැමියාට ගමනාගමන පහසුකම් නො තිබිණ. ඇතැම් විට ගමන් බිමන් ගියේ ජල මාර්ගවලිනි. ඒ සඳහා භාවිත කළේ පාරුවයි. ඒ දුෂ්කර ගමනේ වෙහෙස නිවා ගැනීමට ඔවුහු මෙවැනි කවි කීහ.

පූරුවේ කරපු අකුසල ගෙවන්නට
පාරුවේ ඇවිත් දුක් විඳිනව දැනට
මාරුවේ හබල අදිමින් විටින් විට
සීරුවේ බැසපි ගොස් තුන් මෝදරට

සූරිය උදුවනතුරු පිනි බැවිල්ල
පාරුව පදින තුරු සයුරේ සෙලවිල්ල
මාරුව බල බලා සිත යට කැරකිල්ල
කාරිය කෙරෙනතුරු කාගෙත් රැවටිල්ල

අතීතයේ ප්‍රවාහන කටයුතු සඳහා යොදාගත් වාහනය ගොන් බැඳි කරත්තයයි. ඈත ප්‍රදේශවලට පවා භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා කරත්තවලින් යෑමට සිදු විය. ගොනුන් සමඟ යන කරත්තකරුවෝ මෙවැනි කවි කීහ.

තණ්ඩලේ දෙන්න දෙපොළේ දක්කනවා
කටුකැලේ ගාලෙ නොලිහා වද දෙනවා
හපුතලේ කන්ද දැකලා බඩ දනවා
පව්කළ ගොනෝ ඇදපන් හපුතල් යනවා

දූප්පත් කමට ගොන් බැඳගෙන දක්කනවා
කන්නත් නැතිව දිවරෑ අපි වෙහෙසෙනවා
ගොන්ටත් නොයෙක් වද දීලා ගෙනයනවා
දැන්වත් අපට දෙවියෝ පිහිටක් දෙනවා

## ක්‍රියාකාරකම 01

- මේ ජනකවි තාලානුකූල ව ගායනා කරන්න.

- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

  i. විවිධ වෘත්තීන්හි යෙදෙන ජනතාව කවි කීවේ කුමක් නිසා ද?
  ii. ගොයම් කපන අඟනන් සිටි ආකාරය ජනකවියා දැක ඇත්තේ කෙසේ ද?
  iii. රජතුමා ගොයම් කපන අය දෙස බලා සිටින ආකාරය දැක්වීමට යොදා ඇති උපමාව කුමක් ද?
  iv. බඹරුන්ගෙන් ලැබෙන දේවල් ලෙස මෙහි කියැවෙන්නේ මොනවා ද?
  v. බඹර කපන්නා තුළ දැක්වෙන කුමන ගුණයක් මෙහි පැවසේ ද?
  vi. පාරු කවියා එසේ දුක් විඳීමට හේතුව ලෙස දැක්වෙන්නේ කුමක් ද?
  vii. මෙහි එන පාරු කවියක ආප්තෝපදේශයක් සඳහන් වේ. එය ඇතුළත් කවි පදය ලියන්න.
  viii. කරත්තකරු දෙවි පිහිට ඉල්ලන්නේ ඇයි ?

## ක්‍රියාකාරකම 02

**පහත සඳහන් පද යොදා අර්ථවත් වාක්‍යය බැගින් තනන්න.**

ගොයම්, කුඹුර, කෙත, බැද්ද, බඹරු, පාරුව, ගාල, දෝනාව, තණ්ඩලේ

## ක්‍රියාකාරකම 03

i. පහත දැක්වෙන කවි තාලානුකූල ව ගායනා කරන්න.
ii. මේ කවිවල ඇතුළත් තොරතුරු අනුව ඒවා කුමන වෘත්තීන්ට අයත් දැයි කෙටියෙන් විස්තර කරන්න.

i. මම කන කෑමත් උන්දෑ දනිතෙයි
මම බොන බීමත් උන්දෑ දනිතෙයි
කුණාගෙ යකඩත් මම්ම තළක්කෑයි
කුණිගේ යකඩත් මම්ම තළක්කෑයි
උන්දැගෙ යකඩත් මම්ම තළක්කෑයි
මම්ම තළක්කෑයි

ii. මෙද හේනෙ පැහිලා ඇත කුරක්කන්
රන්වන් කරල් බරවී ඇත කුරක්කන්
ඌරන් නොකෑවොත් හේනේ කුරක්කන්
බඩගින්නට අවුසදයකි කුරක්කන්

iii. ගොනුගෙ පයේ රනින් විල්ල
අපේ පයේ රිදී විල්ල
කමත වටට කරකැවිල්ල
උනා වරෙන් බැත වළල්ල

## ක්‍රියාකාරකම 04

**පහත සඳහන් වගුවෙහි ජන කොට්ඨාසය / වෘත්තිය යන්න සම්පූර්ණ කරන්න.**

| සුවිශේෂ වහර | සාමාන්‍ය වහර | ජන කොට්ඨාසය/ වෘත්තිය |
|---|---|---|
| යතුර | කුල්ල | |
| මැඩුවම | පිදුරු | |
| අම්බරුවන් | මී හරක් | |
| ඇඹුල | ආහාර | |
| හැන්නැදි රාල | ඔරුව අයිතිකරු | |
| බැද්ද | කැලය | |
| අම්මිලැත්තෝ | අම්මා | |
| ඔටා දමනවා | නටනවා | |
| තණ්ඩලේ | නායකයා | |

## ක්‍රියාකාරකම 05

අප රටේ ඒ ඒ ප්‍රදේශවල ව්‍යවහාර කරන පහත සඳහන් වචන ඇතුළත් වගුවට අවධානය යොමු කර ඒවා භාවිත කරන ප්‍රදේශ නම් කරන්න.

| පොදු ව්‍යවහාරය | ප්‍රදේශීය ව්‍යවහාරය | භාවිත කරන ප්‍රදේශය |
|---|---|---|
| තාත්තා | අප්පුච්චා/ අප්පච්චි | |
| සීයා | අත්තා/ ආතා/ මුත්තා | |
| ලොකු අම්මා | මහම්මා | |
| එන්න | එන්ට | |
| හිතුවා | හිතච්චා | |
| දැම්මා | දැවා | |
| පුළුවන් | ඇහැකි | |
| කන්න | කන්ට | |
| මොකටද | මක්කටෙයි | |
| කුඩා | හිච්චි | |

### පැවරුම්

1. ඔබ පළාතට හෝ ප්‍රදේශයට හෝ ගමට සුවිශේෂ වූ ඥාතිත්වය, ආහාරපාන, ක්‍රියාකාරකම්, බඩු භාණ්ඩ, කෙළි සෙල්ලම් ආදි දේ සඳහා භාවිත වන වචන එක් රැස් කරන්න. ඒවා වගුවක යොදන්න.
2. විවිධ ජනශ්‍රැති එක්රැස් කරන්න.
3. විවිධ ජනකවි එකතු කරන්න.